සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා චක්‍රලේඛ අංක 41/2026

මගේ අංකය PPSC/ES/07/FI/6/3/6-1
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභකාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නවනගරය, රත්නපුර
2026.10. 12

සබරගමුව පළාත් සභාවේ
01. ප්‍රධාන ලේකම්, ස.ප.ස.
02. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය,ස.ප.ස.
03. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,ස.ප.ස.
04. සහකාර පළාත් පාලන කොමසාරිස්, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය,රත්නපුර/ කෑගල්ල

## සබරගමුව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

සබරගමුව පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරී II වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

02. විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් යුක්ත වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර ප්‍රශ්න පත්‍ර දෙකම සමත් වූ පසු සමස්ත විභාගය සමත් වූවා සේ සැලකේ. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබා ගත යුතුය.

03. අදාල බඳවා ගැනීම් පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 01 | පළාත් පාලන අණපනත් | පැය 03 | 01. මහ නගර සභා, නගර සභා හා ආඥා පනත් සහ ප්‍රාදේශීය සභා පනතේ මහජන උපයෝගීතා සේවා,මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ විධිවිධාන<br><br>02. මහ නගර සභා, නගර සභා , ආඥා පනත් සහ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි සම්මත කර ක්‍රියාත්මක කරනු ලබන පොදු අතුරු ව්‍යවස්ථා වල පුස්තකාල, ප්‍රජා ශාලා,මහජන සෞඛ්‍ය සනීපාරක්ෂාවට අදාළ විධිවිධාන<br><br>03. පළාත් පාලන ආයතනවල පොදු කළමනාකරණය , මූල්‍ය කළමනාකරණය හා පොදු සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන විධිවිධාන හා ක්‍රියාමාර්ග |
| 02 | ප්‍රජා සංවර්ධන හා පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | පැය 03 | 01. ප්‍රාදේශීය සංවර්ධනය<br><br>02. සංවර්ධනය හා එහි සමස්ත අරමුණු<br>03. ප්‍රාදේශීය සැලසුම්කරණය , මූලධර්ම හා |

| | | | |
|---|---|---|---|
| | | | ගැටළු<br><br>04. ප්‍රාදේශීය මට්ටම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම. ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති පාලනය<br><br>05. තොරතුරු එක් රැස් කිරීම. දත්ත විශ්ලේෂණය හා විවිධ වැඩසටහන් විමර්ෂණය<br>06. ප්‍රජා සංවර්ධනයෙහි සමස්ථ අරමුණු හා සංකල්ප<br><br>07. සහභාගිත්ව සංවර්ධනය හා උපාය මාර්ග<br>08. විවිධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම ,ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය<br><br>09. ග්‍රාමෝදය මණ්ඩල, ප්‍රජා මණ්ඩල , වෙනත් විවිධ ස්වේච්ඡා සංවිධාන සංස්ථාපනය, ක්‍රියාකාරිත්වය හා එම සංවිධාන ප්‍රජා සංවර්ධන සඳහා ප්‍රජා සංවිධාන වශයෙන් උපයෝගි කර ගැනිම<br><br>10. ප්‍රජා අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන පුස්තකාල, ආයුර්වේද බෙහෙත් ශාලා, ළදරු පාසල්,මාතෘ හා ළදරු සායන මධ්‍යස්ථාන , වෙනත් විවිධ ග්‍රාමීය ආයතන උපයෝගී කර ගැනීම<br><br>11. සමෘද්ධි හා විවිධ සමාජ සංරක්ෂණ වැඩසටහන් අරමුණු හා ක්‍රියාකාරිත්වය<br><br>12. රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවර්ධන සම්බන්ධයෙන් ඒවායේ වැදගත්කම<br><br>13. පරිසර සංරක්ෂණය හා කළමනාකරණය<br><br>14. ජාතික පාරිසරික පනත අරමුණු බලතල හා ක්‍රියාකාරිතවය<br><br>15. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත පවරා ඇති බලතල හා ඒවා ක්‍රියාවට නැංවිම<br><br>16. දිස්ත්‍රික්.ප්‍රාදේශීය පරිසර කමිටු අරමුණු හා ක්‍රියාකාරිත්වය<br><br>17. ජාතික ජල සම්පාදන වැඩසටහන් ,ජාතික හා පළාත් ප්‍රතිපත්ති .පළාත් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු<br><br>18. ග්‍රාමීය ජල සම්පාදන කමිටු අරමුණු හා ක්‍රියාකාරිත්වය |

04. ඒ අනුව මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය නිලධාරීන් මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව අයදුම්පත් තම පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා මගින් 2026.10.30 දිනට ප්‍රථම ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

05. මෙම විභාගය පැවැත්වීමට නියමිත දිනය,ස්ථානය අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේදී දැනුම් දෙනු ලැබේ.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

**<u>සබරගමුව පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන II ශ්‍රේණියේ නිලධාරින්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026</u>**

01. (I) මුලකුරු සමඟ නම :.........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න උදා :- SILVA A.B.)

(II) සම්පූර්ණ නම:-.............................................................................................................................

(III) මුලකුරු සමග නම..........................................................................................................................

(IV) රාජකාරි ලිපිනය :.........................................................................................................................

.........................................................................................................................

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(V) ස්ත්‍රී/පුරුෂ භාවය ..................................................

(VI) දුරකතන අංකය :- රාජකාරි................................... පෞද්ගලික...................................

(VII) ඉදිරිපත් වන විෂය/විෂයයන්:-

| විෂයය | විෂය අංකය |
|---|---|
| ............................................. | ................................... |
| ............................................. | ................................... |

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | |

03. උපන් දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. (අ) ඔබ ප්‍රජා සංවර්ධන නිලධාරි I ශ්‍රේණියට පත්වූ දිනය:-..................................................

(ආ) 2026..10.30......දිනට එම ශ්‍රේණියේ සේවා කාලය:-...............................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බවද ප්‍රකාශ කරමි.

දිනය :- ..................................................................

අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ අත්සන

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට /අපේක්ෂිකාවට විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බව සහතික කරමි.

දිනය :- .........................................................

දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)